ගී සඳලුව
Gee... Sandaluwa

# ආදර සැමරුම්



සිසිර දිසානායක

පසුගිය කාලයේ මෙල්බන් නුවර සංගීත ප්‍රසංග බොහොමයක් වේදිකා ගත වුණා. මව් බිමේ ප්‍රවීණ ශිල්පීන් වගේම ජනප්‍රිය ශිල්පීන් ද මේ ප්‍රසංගවලට දායක වුනා. ඒ අතර ගායනයෙන් මෙන්ම ඉදිපත් කිරීමෙන් ද යම් වෙනසක් කළ ප්‍රවීණ ජනප්‍රිය සංගීතවේදියෙකු ගැන සිහිපත් කරන්න කැමතැයි. ඒ 'සීහ රෑ වසන්තේ'' ප්‍රසංගය සඳහා සිය බිරිඳ වන මල්කාන්ති ශිල්පිනියක් සමඟින් මෙහි පැමිණි නබ්ලි වාදු විශාරද, ගායන නිපුන් සනත් නන්දසිරි මහාචාර්යවරයායි. ප්‍රසංගය ඉදිරිපත් කිරීමේදී තමන්ගේ ගායනාවක් අතරතුර විනෝදය දනවන කතා පැවසීමෙහි ලා මහාචාර්යවරයා දක්වන්නේ අපූරු හපන්කමකි. මව් බිමේ සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ තමන්ගේත් සංගීතය හදාරන විද්‍යාර්ථීන්ගේ අවධානය දිනා ගැනිමටත් මෙවන් කතා පවසන්නේ දැයි විටෙක අපට සිතෙනවා.

අචාර්ය අජන්තා රණසිංහගේ ලියා තමන්ම කනුව හා සංගීතය නිර්මාණය කරගෙන ගැයූ ''-ආදර සැමරුම්'' ගීය ගැයීමට පෙර සනත් නන්දසිරි සංගීතවේදීයනන් පැවසූ එවන් කතාවකින් අප ''ගී සඳැළුවවට'' ගොඩවදිනවා.

'' ඒ කාලේ අජන්තලා අපි නිතර මුණගැහෙනවා. ගෙදරත් යන-එනවා. අජන්තා හරිම අදාරෙයි. ඉන්දියාවට එහේ තියන කලාවන්ට'' සංගීතවේදියාණන් ආචාර්ය අජන්තා රණසිංහ ප්‍රවීණ ගීත රචකයාණන් පිළිබඳවවයි මේ කතා කරන්නේ.

''ඉතින් කොහොම හරි සල්ලි ටිකකුත් එකතු කරගෙන අජන්තා ගියා ඉන්දියාව බලලා එන්න. ගිහින් ඇවිල්ලත් අපේ ගෙදර ආවා. මං ඇහුවා ''කොහොමද ඉතින් ඉන්දියාමව? ''කියලා අජන්තා එතකොට කියනවා.

''ඔක්කොමත් හරි, ඉන්දියාවේ ලලනාවො දැක්කහ නං මට හිතුනෙම... '' මහාචාර්ය වරයා ආයෙමත් හිනැවෙනවා. ඒ හිනාවට ප්‍රේක්ෂකාගාරයේ සිටි අපේ හිත්වලට එන්නේ වෙන වෙන අදහස්.

''............මට හිතුනෙම ලංකාවෙ ඉන්නෙත් ලලනාවන් වරයා ඒ කතාව ඉවර කරලා මෙහෙමත් කියනවා.

''අනේ මේ, මං මේව කිව්වා කියලා අජන්තාට නම් කියන්න එපා ඔන්න..... '' ප්‍රේක්ෂකාගාරයම හිනැස්සවීමට මහාචාර්ය තුමා කියන්නේ ඔය වාගෙ කතා ''එදා තමයි සෙ'' ආදර සැමරුම් ගීතයක් මට ලියාගෙන ඇ-වේ.'' සනත් නන්දසිරි සංගීතවේදියා-ණන් ගීය ගායනයට දැහැන් ගත වුණා.

මහාචාර්ය සනත් නන්දසිරි සංගීතවේදියාණන් භාරතයේ සංගීතය හදාරා තිබ්ලාව වාදනයට විශාරද තත්වයන්. ගායනයට නිපුන් තත්ත්වයක් ලබාගත් ශිල්පියෙක්, ඉන්දියාව ගැන කතාව මතක් වුණ නිසා මහාචාර්යවරයාගෙන් ඒ අධ්‍යාපනය පිළිබඳවත් දැනගන්නට ඇත්නම් කියලා හිතුණා.

දැනටත් සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන මහාචාර්යවරයා නිවසේ පවත්වන සංගීත පන්ති නිසාවෙන් අන්තවලක් කාර්ය බහුලයි. කෙලෙසින් දිවා අහාර වේලවක කෙටි පිලිසඳරකට මහාචාර්යවරයාණන් එක්කර ගන්න ටිකදිනකට පසුව අප සමත් වුණි. ''මම ඉන්දියාවට ගියේ 19670 අවුරුද්දෙදි. භාත බන්ඩේ විශ්වවිද්‍යාලයට අතුත් වූණෝ ගායනය හදාරන්නයි. ''මහාචාර්යවරයාගේ ගැඹුරු හැ දුරකතන කම්පනය කලා. විශාරද උපාධියට අවුරුදු පහ හමාරක් ගත කරන්න ඕන. මෙම ඒ අතරේම තබ්ලා වාදනය ඉගෙනගන්නන් ඇතුලත් වුණා. ඒකටත් අවුරුදු පහ හමාරක් ගතවෙනවා. ඒ වුණත් දෙකම ඒ අවුරුදු පහ හමාර ඇතුලතට කරගන්න මට පුළුවන් වුණා. ගායනයටත් වාදනයටත් දෙකටම මම විශාරද උපාධි ලබාගත්තා. ඒ වසරේ ගායනයට මට පළමු පෙළ විශාරද සාමාර්ජයක්ම ලැබුණා.''

'මම තබ්ලාව හැදෑරුවෙ උස්තාද් අහමඩ් ජාන් තිරක්වා ගුරු දේවායණන්ගෙන් එතුමා තමයි ඉන්දියාවේ පහළ වුණ ශ්‍රේෂ්ඨතම තබ්ලා වාද්‍ය ශිල්පියා අතීතයටත් අදටත්. හෙටවත් ඒ වාගේ කෙනෙක් නෑ කියලයි කියන්නේ.''

අනාගතයේ දීමත් එතරම් දක්ෂයෙක් පහළ නොවෙයි. කියලා කියන්නේ කොහොමද?

''ඒකට හේතුවක් තියෙනවා. සංගීතය විතරක් නෙවෙයි ඕනම කලාවකට උපන් හැකියාවක් තියෙන්නෙ ඕන'' ඒ කියන්නේ නිසඟ කුසලතාවය.........

''ඒ වගේම හරි විදියේ අධ්‍යාපනයක් තියෙන්නේ ඕන'' ඒ කියන්නේ ව්‍යුත්පත්තිය.

''ඔය දෙකට අමතරව නිරතුරුව තමන්ගේ විෂය අභ්‍යාසයේ යෙ-දෙන්නත් ඕන'' ඒ සතත අභ-ඍාසය.

''ඉතින් උස්තාද් අහමඩ් ජාන් තිරක්වා ආචාර්ය තුමා දවසට පැහ දහ අට ගානේ අවුරුදු විස්සක් දිනපතාම තබ්ලා වාදනය අභ්‍යාස කරලා තියෙනවා. ඒ නිසයා එතුමා ඒ තත්ත්වයට පත් වුණේ. එතුමා ගෝලයෝ වැඩිය හැදුවේ නෑ. ඒ තමන්ගේ තත්ත්වයෙන් උගන්වන දේ ගන්න පුළුවන් අයත් අඩු නිසා වෙන්න පුළුවන්. ඒ වගේම තමන්ගේ අවශ්‍යථා අනුව පුහුණු වෙන්න කැප වෙන අප අඩු නිසා වෙන්නත් පුළුවන්. ඒත් එතුමා මට ඉගැන්නුවේ හරිම ආදරයෙන්.'' වැඩිදුර අධ්‍යාපනය?

''නිපුන් උපාධියට මම ආපසු භාත්බණ්ඩේ විශ්වවිද්‍යාලයට ඇතුල් වූනේ ඊට අවුරුදු පහළොවකට පස්සේ. ඒ උපාධියට අවුරුදු තුනක් ගත කළා. ඒ නිසා මම ඒ විශ්ව විද්‍යාලෙයේ අවුරුදු අට හමාරක් ගත කරලා තියෙනවා.''

මහාචාර්ය සනත් නන්දරසිරි ශිල්පියා-ණන්ගෙන් මව් බිමේ සංගීත අධ්‍යාපන ක්ෂේත්‍රයටත්, සිංහල ගීත ක්ෂේත්‍රයටත් ලැබුණ දායකත්වය ඉහළයි.

''මට සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ආචාර්ය පදවිය ලැබුණෙු 1969 දියි. ඒ එක්කම ගුවන විදුලිය, රූපවාහිනිය චිත්‍රපට ක්ෂේත්‍රය වාගේ විවිධ මාධ්‍ය තුළත් මම සංගීත අධ්‍යක්ෂවරයෙක් විදියටත්, ශිල්පියෙක් විදියටත් එදා ඉඳන් මේ දක්-වාම මගේ දායකත්වය ලබා දෙනවා'' පිළි සඳර නිම කරමින් සංගීතවේදියාණන් කියා සිටියා'' අප ''ගී සඳැළුව''පාඨකයන් වෙනුවෙන් සංගීතවේදියාණන් හට ස්තුති පූර්වක වුණා. ඒ වගේම නිරෝගී සුවයක් දීර්ඝායුෂත් ප්‍රාර්ථනා කළා.



**ආදර සැමරුම් කැටි වූ**
**නෙතු කඳුලින්, මුතු පබුලින්**
**නිමා කළෙමි සිහිවටනය යමුනා තීරේ**
**එවන් නිමල මැදුර කරා වඩින්න දේවියේ**
**මහද අඳුරු ලෙන අතහැර වඩින්න දේවී**

**දහසක් මිණි මල් ලියකම්**
**පෙම පිද වූ රන් කැටයම්**
**යමුනාවේ තරඟ මතික් මට පිළිඹිබූ වේවා**
**චමත්කාර අතීත සඳ යළිත් ජනත වේවා.**

**අපගේ පෙම් පුරාවතින්**
**දෙරන හෙලු කඳුළු ගලා**
**මැදුරක කිරි ගරුඬ පවුරු පබා කැළුම් දේවා**
**සනාතනික පෙම් සටහන් එහි සිතුවම් වේවා.**

**රචනය : ආචාර්ය අජන්තා රණසිංහ**
**තනුව, සංගීතය හා ගායනය :**
**මාහාචාර්ය සනත් නන්දසිරි**

පොත පත දෙසට හෙලන විමසුම් ඇස
# “සාහිත්‍ය සම්භාෂණ”
ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන
**“සාහිත්‍ය සම්භාෂණ”**
**එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්**
දෙමසකට වරක් අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.
අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/